


# මේ උයන් තෙරේ



මේ උයන් තෙරේ
මේ තුරු සෙවනේ
ඔබේ කතා මට තව ම ඇසේ
මේ නදී තෙරේ
මේ අඩි පාරේ
ඔබේ සිනා මට තව ම පෙනේ

ඔබ එදා කියූ වදන් ලියා ඇති සිතේ
නෑ ඉතින් යළිත් සදා අන් සිතක් කෙරේ
අතර මඟක මා් දමා තනිව ඒ ලොවේ
කොහෙද ඔබ ගියේ - කියන්න
කොහෙද ඔබ ගියේ....,?

අප එදා පෙමින් වෙලී දෙපා නැගූ මගේ
නෑ තවත් ඇසී ගියේ මුදු වදන් ඔබේ
යළඳු එබ එතැ'යි පතා හිඳිමි එටි ලොවේ
කොහෙද ඔබ ගියේ - කියන්න
කොහේද ඔබ ගියේ....?

*ගායනය* :විශාරද නිර්මලා රණතුංග
*තනුව හා සංගීතය* :
ආචාර්ය වික්ටර් රත්නායක
*රචනය* : කුලරත්න ආරියවංශ

යෞවන ආදරය පිළිබඳව වන නිර්මාණ නම් බොහෝමයි. කලා නිර්මාණ අතරට මෙ පමණට ම ආදර කතා ගොනු වීමට හේතුව වන්නේ ඉන් නැංවෙන සුන්දරත්වයයි. සුන්දර කලා නිර්මාණ වලට වඩාත් ම ආශක්ත වෙන්නේ යෞවනයේදී යි. යෞවනයට පොදු මාතෘකාව වෙන්නේ ආදරයයි.

ජීවිතයේ අසුන්දරයැ'යි නම් කෙරෙන අත්දැකීම් පවා 'ආදරය' යන මාතෘකාව යටතේ දී නම් ගෙන එන්නේ සුන්දරත්වය ම යි. ඒත් ඒ වෙනම ම සුන්දරත්වයක්. පෙම් යුවලකගේ විරහ වේදනාව, ඊට පසුබිම් වන හේතු, බලපෑම් කරනා පිරිස, යනා දී මෙකී, නො කී සියළු කාරණා කලාවක් සමඟින් මුසු වී රසිකයින්ට ගෙන එන්නේ විප්‍රලම්භ ශෘංගාරයක්. තම පෙම් පුරාවතේ පාරිසරික පසුතල අතරේ තනිවන විරහී පෙම්වතියකගේ අතීතාවර්ජන ඇයගේ සිතට ගෙන දෙන වේදනාවන් කැටි කරගත් පද රචනාවකි, 'මේ උයන් තෙරේ' ගීය.

ඔහු ඇය හැර ගිහින්. ඒත් ඇය තවමත් සිය පෙම් පාරාදීසියේ මනෝමයෙන් සරන්නී, ඔහු සමඟ හුදෙකලාව ගත කළ පරිසරයෙන් ඔහුගේ හඬ, රුව යළිඳු මවාගන්නී ය. උයන් කෙළවරේ තුරු සෙවනක ඔහු තෙපලූ පෙම්වදන් තවමත් ඇසේය, ඇයට. ගංගා තෙරක, අඩිපාරක මුණ ගැසී නැංවූ ඔහුගේ සිනා තවමත් පෙනේ ය, ඇයට.

ඒ සමඟින් ම ඇයට සිහිපත් වෙන්නේ ඔහු එදා තෙපලූ වදන්වල වූ ප්‍රේමාන්විත අදහස්. ඒ අදහස් ඇයගේ සිතේ සදහටම ලියැවිලා. ඉතින් ඇයට අන් අයෙකු ගැන සිතන්නට නෑ ඉඩක් තවත්. ඇය ආදරණීය මාවතක අතරමං කර කොහේ ද ඔහු ගියේ....,? සිතා ගන්නට නො හැකියි ඇයට. සොයනවා, ඇය ඔහු ව.

එදා ඔවුන් ප්‍රේමාන්විතව වෙලී දැවටෙමින් ගමන් කළ මං පෙතේ ඔහුගේ මුදු වදන් නෑ ඇසෙන්නේ දැන්. ඒ හඬ ඈතින් ඈතට පාව ගිහින්. ඒත් ඇයට එක් බලාපොරොත්තුවක් වෙයි. ඒ ඔහු නැවත ඇය සොයා එන බවට. ඒ මනෝමය සිතුවිල්ලෙන් පිරුණු ඇයගේ ම ලොවක තනිවෙලාය, දැන් ඇය. ඔහු යළි ඒවා.....! ය යන පැතුමත් සමඟින් ය ඇය හුදෙකලාව සිටින්නේ. ඒත්... ඇය නොදන්නීය ඔහු ගිය ඉසව්වක්. සිතා ගන්නට නොහැකියි ඇයට ඒ ගැන. 'කොහෙද ඔහු ගියේ' යැයි කියනා ලෙස අයැදියි ඔහුගෙන් ඇයගේ සිත නිරතුරුවම.

අපගේ ගී පුරාවතේ ආරණීය ම ගී පද නිබන්ධකයින් දෙදෙනා අතරින් අයෙකු වෙන කුලරත්න ආරියවංශයන්ගේ තවත් ආදරණීය විරහ පද ගෙත්තමක්, 'මේ උයන් තෙරේ'. ඉතාම කෙටි පදවලින් රචනාවට මුල මුරනා ගී පද නිබන්ධකයාණන්, කවියකින් ගී පද රචනාවක් වෙනස් වන ලකුණු මුලදී ම පෙන්වයි. ශබ්ද රසය ඉස්මතු කරවන ගායනීය වදන්, පද දෙකින් දෙකට රැ කෙන එළිසමය ඊට නිදසුන්. මුල් ස්ථායී කොටසේ මුල් දෙපද මාත්‍රා අටකට කෙටි වුව, එළිසමය නො රැකී ශබ්ද රසය නංවන්නේ 'ඒ' හඬින්. හතරවන, පස්වන පද 'රේ' අකුරින් එළි සමය රැ කෙන්නේ කලින් කී 'ඒ' කාරයෙන්මයි. තුන්වන සහ හය වන පද මාත්‍රා දාහතරක් දිගට ලියැවී නිමවෙන්නේ යළිත් 'ඒ' ශබ්දය ම නැංවෙන ලෙසින්. නිත්‍ය නො වූ විරිතකට හෝ චන්දසකට වුවද, යම් රටාවකට ලියැවුණ ස්ථායි කොටස සංගීත වේදියෙකුට කදිම සම්පත් සපයයි. මූලිකව දිගු පද දෙකක් ලෙසින් ද ස්ථායි කොටස සැළකිය හැකියි.

අන්තරා කොටසේ මුල් දෙපදයේ මුල් දවදන් වන 'ඔබ' 'නෑ' මාත්‍රා දෙකක වදන් වුව ඉතිරි වදන් මාත්‍රා තුනෙන් තුනට බෙදිය හැකි බවක් පෙනෙයි. එහෙත් ඉන් ඉදිරියට පද ලියැවෙන්නේ සම්පූර්ණයෙන් ම නිදහස් රටාවකට. රචකයාණන්ට වඩාත් වැදගත් වන්නේ තමන්ගේ සිතේ නිර්මාණය වී ඇති සංවේදනාව වදන් වලින් නිදහසේ මුදා හැරීම පමණයි.

*'කොහෙද ඔබ ගියේ - කියන්න*
*කොහෙද ඔබ ගියේ.....?*

කුලරත්න ආරියවංශයන්ගේ මේ අපූරු හැඟුම් බර පද පෙළට සංගීතයෙන් අත පොවන්නේ ආචාර්ය වික්ටර් රත්නායකයන්. දිවයිනේ ප්‍රවීණතම මියැසි අදියුරාණවරයෙකු වන රත්නායකයන්ගේ නිර්මාණශිලී ස්වර ග්‍රහණයට පහසුවෙන් ම හසුවන ගුණාංගයන්ගෙන් සපිරි පද රචනාවකි මේ. රචකයාණන් මොන තරම් නිදහසේ ලියූවද මාත්‍රා තුනෙන් තුනට රිද්මය බිඳෙන 6 X 8 තාල රිද්මය ට ආචාර්යවරයාණන් පද පෙළ තනු ගන්වන්නේ විශ්මය ජනක ලෙසට. මෙහි දී නො ගැයෙන මාත්‍රා සහ යති ලෙසින් ඇදී ගැයෙන කොටස් මනා සේ සංකලනය කරගෙන පදරුත් ඉහළින් ම වඩා හිඳුවන්නට ආචාර්ය වික්ටර් රත්නායකයන් සමත් වන්නේ වේදනාව මොනවට කැටි කරමින්. ස්ථායි කොටසේ 'තෙරේ....' 'සෙවනේ....' වදන'ග යති ලෙසින් දීර්ඝව ගැයෙන්නට හරිමින්, 'මේ' වදන වෙනම ම ඉස්මතු කරවමින් ඒ වේදනාවට යම් ආවේගී බවක් රත්නායක සර පෙළහරින් මුහු වන්නේ මේ ප්‍රකාශයන ට යම් නෝක්කාඩුවක ස්වරෑපයක් එක් කරවමින්.

මේ වේදනාව ඉහළින්ම දැනවෙන සේ තනුගත වන්නේ 'කොහෙද ඔබ ගියේ - කියන්න කොහෙද ඔබ ගියේ?' පදයේදීයි.. ඒ කුලරත්න ආරියවංශ රචකයානණ්ගේ සිත තුළ පිළිපන් වේදනවා කැටිවුණ නෝක්කඩුවේ ස්වරෑපයෙන්මයි. අන්තරා කොටසේ මුල් දෙපද වේදනාවෙන් ගැයුවද, ගායනය හැඟීම් බර කරවමින්:

*"අතරමගක මා, දමා තනිව ඒ ලොවේ"*
*යළිදු ඔබ එතැ'යි පතා හිඳිමි ඒ ලොවේ"*

පද වඩාත් මන්ද්‍ර ස්වරවල රඳවන්නට රත්නායකයන් තනුව උත්සුක වෙයි.

මේ ගීයට හඬින් දායකත්වය දෙන්නේ විශාරද නිර්මලා රණතුංග ගායන වේදිනියයි. ඉතාමත් ම හැඟීම්බරව ගායනා වන ඇයගේ කෝමල ලාලිත හඬ වඩාත් තියුණු ලෙස උද්දීපනය වෙන ගායනයකි මේ වේදනාබර නෝක්කාඩුව. නිවැරදි ස්වරථානවල, නළවමින්, දෝලනය කරවමින් ගායනයේදී හඬ මෙහෙයවන නිර්මලා රණතුංග ගායන ශිල්පිනය 'මේ උයන් තෙරේ' ගීය තමන්ට ම නතු කරගන්නේ ඊට උපරිම සාධාරණය ඉටු කර දෙමින්.



සිසිර දිසානායක